# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

## BCOME 2073 - සංවර්ධන ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. " බොහෝමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල පොදු අරමුණු හා ලක්ෂණ දැකිය හැකි වුවත් එම ජාතීන්ට තමන්ටම ආවේණික වූ වෙනස්කම් පවතී. "

සුදුසු උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

ආ. UN, IBRD, UNDP සහ OPEC වර්ගීකරණයන්ට අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල් වර්ග කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. අ. අතිරික්ත ශ්‍රමය නූතන අංශයට අවශෝෂණය කිරීමේදී ලෙවිස් ද්වි- ආංශික ආකෘතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. මෙම ආකෘතිය ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ. " දළ ජාතික නිෂ්පාදිතයේ (GNP) වර්ධන අනුපාතය සහ ඒක පුද්ගල ආදායම පමණක් රටක සංවර්ධනය මැනීම සඳහා ප්‍රමාණාත්මක නොවේ. "

ඔබ මෙම ප්‍රකාශනය සමඟ එකඟවන්නේද ? හේතු සහ සාක්ෂි සහිතව පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20)

04. අ. බද්ධ ආයෝජනයක් වශයෙන්, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති යෝජනා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. සංවර්ධනය වෙමින් පවතින රටවල අධික ජනගහන වර්ධනයට බලපාන ප්‍රධාන හේතු සහ ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

06. පහත දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. මානව සංවර්ධන දර්ශකය

ආ. නිරපේක්ෂ දුගීබව

ඇ. ගිණි සංගුණකය

ඉ. ජනවිකාශන සංක්‍රමණය (Demographic Transition)

(ලකුණු 05බැගින් )

(මුළු ලකුණු 20)